ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: **21**

විෂයය / பாடம்: **ආර්ථික විද්‍යාව**

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 3 | 31. | 3 | 41. | 4 |
| 02. | 3 | 12. | 1 | 22. | 4 | 32. | 4 | 42. | 2 |
| 03. | 1 | 13. | 5 | 23. | 1 | 33. | 2 | 43. | 3 |
| 04. | 4 | 14. | 3 | 24. | 2 | 34. | 1 | 44. | 1 |
| 05. | 3 | 15. | 4 | 25. | 2 | 35. | 5 | 45. | 1 |
| 06. | 5 | 16. | 2 | 26. | 2 | 36. | 4 | 46. | 5 |
| 07. | 4 | 17. | 4 | 27. | 1 | 37. | 2 | 47. | 2 |
| 08. | 4 | 18. | 1 | 28. | 5 | 38. | 3 | 48. | 3 |
| 09. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 5 | 49. | 2 |
| 10. | 3 | 20. | 5 | 30. | 4 | 40. | 3 | 50. | 1 |

○ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 x 50 = 50

PAPERMASTER.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :
* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 01 වන ප්‍රශ්නය

### 'අ' උප කොටස

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

1. (i) "සම්පත් අසීමිතව සහ නොමිලයේ ලබාගැනීමට ඇත්නම් ආර්ථික විද්‍යාව නමින් විෂයයක් නොමැතිවනු ඇත." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පහත දැක්වෙන එක් එක් සිදුවීම රටක නිෂ්පාදන හැකියා වක්‍ර මගින් පෙන්නුම් කළ හැක්කේ කෙසේදැ යි වෙන වෙන ම රූපසටහන් යොදා ගනිමින් කෙටියෙන් විස්තර කරන්න.

(අ) අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය ඉහළ යයි.

(ආ) විරැකියා අනුපාතිකය ඉහළ නංවමින් රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 8% කින් සංකෝචනය වේ.

(ඉ) සෞඛ්‍ය සේවා සඳහා වැඩියෙන් වියදම් කිරීමට රජයට ඉඩ සලසමින් ආරක්ෂක වියදම් අඩු කරන ලදී.

(ඊ) දිග්ගැස්සුණු නියගයේ ප්‍රතිඵල වශයෙන් දීර්ඝ කාලීන විදුලිය කපා හැරීම් සිදු කිරීම

(උ) කාර්මික නිෂ්පාදනය සඳහා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට ලබා දෙන විදේශ විනිමය සීමා කිරීම. (ලකුණු 05යි)

(iii) නිදහස් වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක අවාසි පහක් නම් කරන්න. (ලකුණු 05යි)

(iv) රටක ආර්ථික සම්පත් උපයෝජනය කිරීමෙහි ලා තාක්ෂණයේ සහ ව්‍යවසායකයන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06යි)


01.(i) - ආර්ථික විද්‍යාව වූකලී හිඟකම සහ තේරීම පිළිබඳ අධ්‍යයනයකි. සෑම ආර්ථික ගැටලුවක් ම ඒවායේ මූලික මට්ටමින් බලන විට පෞද්ගලික තේරීමක් හා සම්බන්ධ ය. ඒවා කුමක් කළ යුතු ද කුමක් නොකළ යුතු ද යන්න පිළිබඳ පුද්ගලයන් ගනු ලබන තීරණයන් හා බැඳී ඇත. ඇත්තට ම තේරීමක් පිළිබඳ නොවන කිසිවක් ආර්ථික විද්‍යාව නොවේ යයි කීවද වරදක් නොමැත. **(ලකුණු 02යි)**

- සම්පත් අසීමිතවත් නොමිලයේත් ලබා ගැනීමට ඇත්නම් තේරීම් කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවේ. සෑම පුද්ගලයෙකුට ම ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් තමන් කැමති තරම් හිමිකර ගත හැකි ය. එවැනි තත්ත්වයක් යටතේ තේරීම් පිළිබඳ විද්‍යාව වන ආර්ථික විද්‍යාව අවශ්‍ය නොකෙරේ. **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 04යි)**


PAPERMASTER.LK

(ii)(අ)- අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වයෙහි ඉහළයාමක් රටේ ශ්‍රම හමුදාවේ ඵලදායිතාව ඉහළ නැංවීමට හේතුවන අතර එහි ප්‍රතිඵල වශයෙන් නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට විතැන් වනු ඇත.





(නිවැරදි විස්තරය සහිත නිවැරදි රූප සටහනට ලකුණු 01යි)

(ආ) - මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ පහළ වැටීම පෙන්නුම් කරනුයේ සම්පත් සම්භාරයේ අඩුවීමක් නොව සම්පත් භාවිතයේ අකාර්යක්ෂමතාවයි. මෙය පෙන්නුම් කරනුයේ නිෂ්පාදන හැකියා වක්‍රය තුළ නිෂ්පාදන ලක්ෂ්‍යය ඇතුළතට ගමන් කිරීමක් ලෙස ය. නිෂ්පාදන ලක්ෂ්‍යය A සිට B දක්වා ඇතුළතට ගමන් කරයි.





(ඉ) - නිෂ්පාදන හැකියා වක්‍රයට මේ මගින් බලපෑමක් ඇති නොවේ. ආරක්ෂණ වියදම් සඳහා යොදාගත් සම්පත් ප්‍රමාණය අඩුකොට සෞඛ්‍ය සේවා සඳහා යොදාගනු ලබන සම්පත් වැඩි වීමක් බැවින් නිෂ්පාදන හැකියා වක්‍රය මත අදාළ නිෂ්පාදන සංයෝජන ලක්ෂ්‍යය A සිට B දක්වා වෙනස් වීමක් මගින් මෙය පෙන්නුම් කළ හැකි ය.




(නිවැරදි විස්තරය සහිත නිවැරදි රූප සටහනට ලකුණු 01යි)

PAPERMASTER.LK


(ඊ)- නියඟය නිසා විදුලිය කපා හැරීම පෙන්නුම් කරනුයේ රටේ සම්පත් සම්භාරයේ අඩුවීමකි. එවැන්නක ප්‍රතිඵලය වනුයේ නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුළතට විතැන්වීමකි.





(නිවැරදි විස්තරය සහිත නිවැරදි රූප සටහනට ලකුණු 01යි)

(උ) - අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ලබාදෙන විදේශ විනිමය සීමා කිරීම පෙන්නුම් කරනුයේ සම්පත් සම්භාරයේ අඩුවීමකි. එහි ප්‍රතිඵලය වනුයේ නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුළතට විතැන් වීම ය.

- ආනයනිත අමුද්‍රව්‍ය අවශ්‍ය නොකරන නිෂ්පාදන ක්ෂේත්‍රයක් ඇති විට ඇතැම් විට හැකියා වක්‍රය එක් පසකින් පමණක් ඇතුළතට විතැන් විය හැකි ය.




හෝ




(නිවැරදි විස්තරය සහිත නිවැරදි රූප සටහනට ලකුණු 01)

(මුළු ලකුණු 05 යි)

(iii) - නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් නිසා ආදායමේ සහ ධන ව්‍යාප්ති විෂමතාවන්ගේ පරිමාව ඉහළ යා හැකි ය.

- ව්‍යාපාරික ආයතන ඒකාධිකාරී බලයක් ලබාගෙන මිල ගණන් ඉහළ දමා පාරිභෝගික සුබ සාධනයට හානි පැමිණවිය හැකි ය.
- පොදු භාණ්ඩ එක්කෝ නොසැපයිය හැකිය නැතහොත් ප්‍රමාණවත් ව නොසපයනු ඇත.
- සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි සුබසාධන භාණ්ඩ ප්‍රමාණවත් ව නොසැපයිය හැකි ය.
- නිෂ්පාදනයේ හා පරිභෝජනයේ සෘණ බාහිරතාවන් නිවැරදි කිරීමට අසමත් වනු ඇත.
- තොරතුරු ප්‍රමාණවත් නොවීම සහ වෙළෙඳපොළ හැසිරීම්වල අඩුපාඩු නිසා වෙළෙඳපොළ හැඩ ගැසීම් සහ ගැළපුම් මන්දගාමී සහ දැඩි උච්චාවචන ස්වරූප ගත හැකි ය.
- නිදහස් වෙළෙඳපොළ තුළ සෑම ව්‍යාපාරික ඒකකයක් ම හැකිතාක් ලාභ උපයා ගැනීමට වෙහෙසෙන බැවින් සේවක ආරක්ෂාව, පාරිසරික ප්‍රමිතිය, ආචාරධර්ම යනාදිය කැප කරනු ලැබිය හැකි ය.
- පාරිභෝගික සූරාකෑම
- ධනයට විෂම වීම.

PAPERMASTER.LK

- සාර්ව ආර්ථිකයේ අස්ථායිතාවන් බිහිකරනු ඇත.
- මූල්‍ය වෙළෙඳපොළවල් නියාමනයන්ගෙන් තොර ව හැසිරීම නිසා දැඩි මූල්‍ය අස්ථායිතාවන් හටගත හැකි අතර ඒවාට කිසිදු සම්බන්ධයක් නොමැති මිලියන සංඛ්‍යාවක් ජනතාව විපතට පත් විය හැකි ය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05යි)

(iv) තාක්ෂණය :

- තාක්ෂණය විශාල දැනුම් සම්භාරයකින් සහ මෙවලම් සමූහයකින් සමන්විත වන අතර එමගින් භාණ්ඩ හා සේවා කාර්යක්ෂම ව සහ නව්‍යතාවන්ගෙන් යුතු ව නිපදවීම සඳහා ආර්ථික සම්පත් පහසුවෙන් යොමු කර වීමට පිළිවන.
- තාක්ෂණය නිසා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට සහ බෙදාහැරීමට වැය වන කාලය ඉතිරි වේ. එලෙස ඉතිරි කරගනු ලබන කාලය සේවකයන් විසින් ඵලදායි කාර්යයන් සඳහා යෙදවීමෙන් නිෂ්පාදන ආයතනයේ සමස්ත ලාභ ඉහළ නගිනු ඇත.
- තාක්ෂණය නිසා ශ්‍රමික විභාජනය සහ විශේෂ ප්‍රාගුණ්‍යනය ඉහළ නංවා ගැනීමට ඉඩ ලැබෙන අතර සම්පත් භාවිතය තවදුරටත් කාර්යක්ෂම වීමට එය දායකත්වය සපයයි.
- තාක්ෂණයේ ප්‍රතිඵල වශයෙන් සේවක සංනිවේදනයන් කාර්යක්ෂම වීම නිසා ඵලදායිතාව ඉහළ නගිනු ඇත.
- ව්‍යාපාරයට සහ ව්‍යාපාරික පරිසරයට අදාළ නවතම තොරතුරු සඳහා ප්‍රවේශයක් තාක්ෂණය නිසා හිමි වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

ව්‍යවසායකයන් :

- තාක්ෂණික දියුණුවක් හටගත් පමණින් නිෂ්පාදනයේ ප්‍රසාරණයක් සිදු නොවන අතර එය සිදුවනුයේ ව්‍යවසායකයන් විසින් තාක්ෂණික වෙනස්කම් නිෂ්පාදන ක්‍රියාවලියට අනුගත කළ විට දී ය.
- උපයෝජනය නොකළ සම්පත්, ශ්‍රමය සහ ප්‍රාග්ධනය වඩාත් කාර්යක්ෂම ව උපයෝජනය කරනුයේ ව්‍යවසායකයන් විසිනි.
- සෑම ව්‍යාපාරික අංශයක් සඳහා ම නව්‍යතාවන් හඳුන්වාදෙමින් පවත්නා සම්පත් වඩාත් කාර්යක්ෂම ව උපයෝජනය කිරීමත් එමගින් නිෂ්පාදනය ඉහළ නැංවීමත් කරනු ලබන්නේ ව්‍යවසායකයන් ය.
- ව්‍යවසායකයෝ ඵලදායිතාව ඉහළ නැංවීමට දායක වෙති. ඉහළ ඵලදායිතාව සහිත අළුත් ආයතන සමඟ තරගකාරීත්වය ඉහළ නැංවීමත්, ඵලදායිතාව අඩු ආයතන වෙළෙඳපොළෙන් ඉවතට යාමට සැලැස්වීමත් මගින් ව්‍යවසායකයෝ ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීමට විශාල මෙහෙවරක් සපයති.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 06යි)

PAPERMASTER.LK

**02 වන ප්‍රශ්නය**

2. (i) සැපයුම් වක්‍රයක් අදින විට ස්ථාවරව පවතී යැයි සලකනුයේ කුමක් ද? (ලකුණු 03යි)

(ii) සිගරට් සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව – 0.75ක් පමණ වන බව පර්යේෂණ අධ්‍යයන හෙළි කොට ඇත. වර්තමානයේ සිගරට් පැකට්ටුවක මිල රු. 1500ක් වේ නම් සහ දුම්පානය 30%කින් අඩු කිරීමට රජයට අවශ්‍ය වේ නම්, සිගරට් පැකට්ටුවක මිල කොපමණ ප්‍රමාණයක් විය යුතු වේ ද? (ලකුණු 05යි)

(iii) මිල නොවන ඕනෑම සලාකන ක්‍රම **තුනක්** නම් කොට, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) භාණ්ඩයේ මිල ඉහළ යන විට පාරිභෝගිකයන් එම භාණ්ඩය අඩුවෙන් ඉල්ලුම් කරන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

02. (i)
- නිෂ්පාදන සාධකවල මිල
- නිෂ්පාදනය හා සම්බන්ධිත භාණ්ඩවල මිල
- අපේක්ෂිත අනාගත මිල
- සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව
- තාක්ෂණය
- ස්වාභාවික සාධක

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)**

(ii)
- මිල ඉල්ලුම් නම්‍යතා සූත්‍රය :
- $\dfrac{\text{ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ \% වෙනස}}{\text{මිලෙහි \% වෙනස}}$ $\Sigma = -0.75$

(ලකුණු 01යි)

- මින් අදහස් වන්නේ මිල 1%කින් වෙනස් වුවහොත් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය 0.75%කින් වෙනස් වන බව ය.

- එසේනම් ප්‍රමාණය 1%කින් වෙනස්වීම සඳහා මිල % කොපමණකින් වෙනස් විය යුතු ද?

- $\dfrac{(1.00\%)}{(0.75\%)} = \dfrac{100}{75} = \dfrac{4}{3} = 1\dfrac{1}{3}$

- ප්‍රමාණය 30%කින් වෙනස් වීමට මිල කොපමණ ප්‍රතිශතයකින් වෙනස් විය යුතු ද?

$30 \times 1\dfrac{1}{3} = 30 \times \dfrac{4}{3} = 40\%$

නැතහොත්

- $\dfrac{(1.00\%)}{(0.75\%)}$ $30\%$ $\dfrac{100}{75} = 30 = 40\%$

(ලකුණු 02යි)

- සිගරට් පැකට්ටුවේ වර්තමාන මිල = රු. 1500
- ඉල්ලුම් ප්‍රමාණය 30%කින් අඩු කිරීම සඳහා සිගරට් පැකට්ටුවේ මිල කොපණකින් ඉහළ යා යුතු ද? 40%කිනි.
- එසේ නම් පැකට්ටුවේ මිල කොපමණ විය යුතු ද?

PAPERMASTER.LK

- $1500 \times \dfrac{140}{100} =$ රු. 2100.00

(ලකුණු 02යි)

(මුළු ලකුණු 05යි)

(iii) - පෝලිම් ක්‍රමය : මෙහිදී භාණ්ඩ ලබා ගැනීම සඳහා පෝලිමේ රැඳී සිටීමට සිදුවන අතර පෝලිමේ පැමිණෙන අනුපිළිවෙළ අනුව භාණ්ඩ ලබා දේ. පෝලිමේ ම භෞතික ව රැඳී සිටීම හැමවිටම අදහස් නොවේ. ඇතැම් විටක පොරොත්තු ලේඛනයක නම ඇතුළු කොට අධි ඉල්ලුම සහිත භාණ්ඩ නාම ලේඛනයේ අනුපිළිවෙළට ලබා දෙනු ලැබේ.

- ලොතරැයි ඇදීම.

- සලාක කූපන්පත් ලබා දීම : දෙන ලද භාණ්ඩයක යම් නිශ්චිත ප්‍රමාණයක් සතියකට හෝ මාසයකට හෝ ලබාදෙනු පිණිස පුද්ගලයෙකුට හෝ කුටුම්බයකට හිමිකම ලැබෙන අවසර පතක් හෝ ටිකට් පතකි.

- ප්‍රමාණය පැහැදි කරගෙන භාණ්ඩ බෙදා දීම. (QR ක්‍රමය.)

- හිතවත්කම මත භාණ්ඩ ලබා දීම : කිසියම් භාණ්ඩයක් සඳහා අධි ඉල්ලුම් තත්ත්වයක් පවතින විටක වෙළෙඳුන් හිතවත්කම මත භාණ්ඩ සළාකනය කරනු ලැබේ. මිතුරන්, දීර්ඝ කාලයක් තිස්සේ ගනුදෙනු කරන පුද්ගලයන්, ඇතැම් විට අලෙවි කිරීමට අපහසු ඇතැම් භාණ්ඩ මිල දී ගන්නා පුද්ගලයන් වැනි අය මෙලෙස හිතවතුන් ලෙස ගැනේ.

- කළුකඩ : වෙළෙඳපොළේ තීරණය වන මිල ගණන් යටතේ නීති විරෝධී ව වෙළෙඳාම සිදුකරන වෙළෙඳපොළ කළුකඩ ලෙස සැලකිය හැකි ය. උපරිම මිල සීමා මෙම වෙළෙඳපොළෙහි නීති විරෝධී ලෙස බිඳ දැමේ. වෙළෙඳපොළේ සමතුලිත මිලට වඩා ඉහළ මිලක් ගෙවීමට සූදානම් පාරිභෝගිකයන් සිටින බැවින් නීතියට පටහැනි මිලක් යටතේ අලෙවි කිරීමට පෙළැඹීමක් ඇත.

- අවස්ථානුකූල ව සැපයීම (Chance Allocation) : ඉහත සඳහන් ක්‍රම භාවිත නොකරන අවස්ථාවන්හි දී හිඟ භාණ්ඩ සපයා දීම කිසියම් අහඹු ආකාරයකට සිදුකරනු ලැබේ. උදාහරණ වශයෙන් අධි ඉල්ලුමක් පවතින ඇතැම් භාණ්ඩ එක්වරම අනපේක්ෂිත ලෙස ඇතැම් වෙළෙඳපොළවල් තුළ අලෙවිකරනු ලැබිය හැකි ය. එම අවස්ථාවේ වෙළෙඳපොළට එන ගනුදෙනු කරුවන්ට එම ප්‍රස්තාවෙන් ප්‍රතිලාභ ලබා ගත හැකි ය.

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 06යි)**

(iv) - භාණ්ඩයේ මිලත් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී. ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ වන්නේ මෙම සම්බන්ධයයි. භාණ්ඩයේ මිල ඉහළ යන විට පාරිභෝගිකයන් එම භාණ්ඩය අඩුවෙන් ඉල්ලුම් කරනුයේ කරුණු දෙකක් නිසා ය. එනම් (1) ආදේශන ප්‍රතිවිපාකය සහ (2) ආදායම් ප්‍රතිවිපාකය යි.

**(ලකුණු 02යි)**

- ආදේශන ප්‍රතිවිපාකය : අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී භාණ්ඩයක මිල ඉහළ යන විට එම භාණ්ඩයේ සාපේක්ෂ මිල වැඩි වේ. සාපේක්ෂ වශයෙන් මිල අධික භාණ්ඩ මිල දී ගැනීම අඩු කොට සාපේක්ෂ වශයෙන් මිල අඩු ආදේශකයන් වැඩි පුර මිල දී ගැනීමට පෙළැඹේ.

**(ලකුණු 02යි)**

- ආදායම් ප්‍රතිවිපාකය : අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී භාණ්ඩයක මිල ඉහළ යන විට පාරිභෝගිකයාගේ මූර්ත ආදායම (මුදල් ආදායමේ ක්‍රය ශක්තිය) පහළ වැටේ. මේනිසා පෙරදී මිලට ගත් සියලු ම භාණ්ඩ දැන් මිලට ගැනීම අපහසු වනු ඇත. ඒ නිසා සාමාන්‍ය භාණ්ඩ වලින් මිල දී ගන්නා ප්‍රමාණ දැන් අඩු කරනු ඇත.

**(ලකුණු 02යි)**

PAPERMASTER.LK

**(මුළු ලකුණු 06යි)**

- ගිෆන්ග උපභෝගික භාණ්ඩ

**03 වන ප්‍රශ්නය**

3. (i) කාර්මික භාණ්ඩ මිල [illegible] (කෘෂිකාර්මික නිෂ්පාදිත [illegible] වන්නේ ඇයි? (ලකුණු 06යි)

(ii) අවම මිලක් (price floor) නිෂ්පාදකයාට වාසි සලසන්නේ නම්, අවම මිල ආර්ථික අතිරික්තය අඩු කරන්නේ ඇයි? රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iii) තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරන කිසියම් නිෂ්පාදිතයක් සඳහා ඇති ඉල්ලුම සහ සැපයුම් වක්‍ර පහත දැක්වෙන සමීකරණ මගින් නිරූපණය කෙරේ යැයි සලකන්න.

ඉල්ලුම: $Q_D = 720 - 4P$ සැපයුම: $Q_S = -120 + 2P$

(අ) නිෂ්පාදිතයේ සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න. (ලකුණු 02යි)

(ආ) දැන් මෙම භාණ්ඩයේ නිෂ්පාදකයන්ට ඒකකයකට රු. 15 බැගින් වන සහනාධාරයක් ප්‍රදානය කිරීමට රජය තීරණය කොට තිබේ යැයි සලකන්න.

(a) සහනාධාරයෙන් පසු ගැනුම්කරු ගෙවන මිල කොපමණ ද? (ලකුණු 03යි)

(b) සහනාධාරයෙන් පසු සැපයුම්කරුට ලැබෙන මිල කොපමණ ද? (ලකුණු 03යි)

03. (i) - කාර්මික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම සමඟ සසඳන විට කෘෂිකාර්මික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම, මිල සහ ආදායම යන දෙකරුණ ම සම්බන්ධයෙන් අනම්‍යතාවක් පෙන්නුම් කරයි. අනම්‍ය ඉල්ලුමක් ඇති විට සැපයුමෙහි හටගන්නා වෙනස්කම් මිලෙහි සාපේක්ෂ ව විශාල වෙනස් කම් ඇති කිරීමට සමත් වේ.

- කාර්මික භාණ්ඩ මෙන් නොව, මේරීමේ පමාව නිසා කෙටි කාලයේ දී කෘෂි කාර්මික භාණ්ඩ වල සැපයුමෙහි අනම්‍යතාවක් පවතී. මිල ගණන් ඉහළ යන විට ඉක්මනින් සැපයුම වැඩි කිරීමේ හැකියාවක් ගොවීන්ට නොමැත. භෝග අළුතින් වගාකොට ඵලදාව ලබා ගැනීම පටන් ගැනීමට අවුරුදු 1 - 5 දක්වා කාලයක් ගත වනු ඇත.

- කාර්මික භාණ්ඩ සමඟ සසඳන විට කෙටිකාලීන වාර්ෂික භෝගයන්හි වෙළෙඳපොළ මිල කෙරෙහි නිෂ්පාදන සංවේදීතාව ඉතා පහළ මට්ටමක පවතී. එම භෝග වගා කිරීමට තීරණ ගනු ලබන්නේ එම අවස්ථාවේ පවතින මිල එසේම පවතී ය යන උපකල්පනය මත මිස ඒවායේ අස්වැන්න ලැබෙන විට පැවතිය හැකි මිල පදනම් කරගෙන නොවේ. එහි ප්‍රතිඵල වශයෙන් විශාල මිල උච්චාවචන හටගනී. ඇතැම් ගොවීන් තම අස්වැන්න ගොවිපොළේ අත්හැර දමා යන තරමට මිල ගණන් පහළ වැටිය හැකි ය.

- කාර්මික භාණ්ඩ මෙන් නොව නිෂ්පාදකයාගේ පාලනයෙන් තොර ස්වාභාවික හේතු (කාලගුණය, කෘමි උවදුරු) මත කෘෂිකාර්මික භාණ්ඩ සැපයුම දැඩි උච්චාවචන වලට පාත්‍ර වේ. කාලගුණය යහපත් වී ඉතා විශාල අස්වැන්නක් අනපේක්ෂිත ව ලැබීම නිසා වෙළෙඳපොළ මිල විශාල වශයෙන් පහළ වැටිය හැකි ය. ලෙඩ රෝග හා කෘමි උවදුරු නිසාත් සැපයුමේ දැඩි උච්චාවචන හට ගැනීමෙන් මිල අස්ථායිතා ඇති විය හැකි ය.

- කාර්මික භාණ්ඩ මෙන් නොව කෘෂි කාර්මික භාණ්ඩ කල්තබා ගත නොහැකි නශ්‍ය භාණ්ඩ ස්වරූපයක් ගනී. එබඳු භාණ්ඩ වල තොග රැස් කොට තබා ගැනීම දුෂ්කර බැවින් ද මිල උච්චාවචනයට පහසුවෙන් ගොදුරු වේ.

(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 06යි)

PAPERMASTER.LK

- රජයේ ප්‍රතිපත්ති (ආනයන පාලනය, බදු පනවා [illegible])
- ගෝලීය වෙළෙඳපොළේ මිලගණන් උච්චාවචන


(ii) - සමතුලිත මිලට වඩා ඉහළ මිලක් අවම මිලක් වශයෙන් රජය ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත්, සමතුලිත මිලට වඩා ඉහළ මිලක් ලබා ගත හැකි බැවින් නිෂ්පාදකයාට ප්‍රතිලාභයක් ලැබේ. මෙහිදී නිෂ්පාදක අතිරික්තය ඉහළ යන අතර පාරිභෝගික අතිරික්තය පහළ වැටේ.

(ලකුණු 02යි)

- වෙළෙඳපොළ සමතුලිත මට්ටමට ඉහළ මිලක් අවම මිල වශයෙන් ප්‍රකාශ කළ විට වෙළෙඳපොළේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට වඩා වැඩි සැපයුම් ප්‍රමාණයක් දක්නට ලැබේ. එසේ වුව ද රජය ප්‍රකාශයට පත් කළ අවම මිලට වඩා වෙළෙඳපොළේ මිල පහළ බැසීමට ද ඉඩක් නොමැත. අවම මිල යටතේ පාරිභෝගිකයන් ඉල්ලුම් කරනුයේ $Q_2$ ප්‍රමාණය පමණක් බැවින් සැපයුම ද එම ප්‍රමාණයට සීමා කිරීමට නිෂ්පාදකයන්ට සිදුවේ. එහි ප්‍රතිඵල වශයෙන් රූප සටහනෙහි දැක්වෙන ආකාරයට C + E ප්‍රමාණයේ සුබ සාධනය අහිමිවීමක් හටගනී.

(ලකුණු 02යි)

- අවම මිල නිසා ආර්ථික අතිරික්තය අහිමි වන ආකාරය පහත රූප සටහනෙහි දැක්වේ.




අවම මිලට පෙර ආර්ථික අතිරික්තය = A+B+C+D+E+F

අවම මිලට පසු ආර්ථික අතිරික්තය = A+B+D+F

අවම මිල නිසා ආර්ථික අතිරික්තයේ අඩු වීම = C+E

* රූප සටහනේ ආර්ථික අතිරික්තය අඳුරු කොට පෙන්විය යුතුයි.

(ආර්ථික අතිරික්තයේ වෙනස්වීම පෙන්නුම්කරන නිවැරදි රූප සටහනට ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

(iii) (අ)- $Q_D = Q_S$

- $720 - 4P = -120 + 2P$

$840 = 6P$

$140 = P$ සමතුලිත මිල (ලකුණු 01යි)

- $Q = 720 - 4(140)$

- $Q = 720 - 560 = 160$ සමතුලිත ප්‍රමාණය (ලකුණු 01 යි)

(ආ) (a) සහනාධාරයෙන් පසු ගැනුම්කරු ගෙවන මිල :

- ගැනුම්කරු ගෙවන මිල ($P_b$) = සැපයුම්කරුගේ මිල ($P_s$) − සහනාධාර

- සැපයුම්කරුගේ මිල ($P_s$) = ගැනුම්කරු ගෙවන මිල ($P_b$) + සහනාධාර (ලකුණු 01යි)

PAPERMASTER.LK

$720 - 4P_b = -120 + 2P_s$

$720 - 4P_b = -120 + 2(P_b + 15)$ (ලකුණු 01යි)

$720 - 4P_b = -120 + 2P_b + 30$

$720 + 120 - 30 = 4P_b + 2P_b$

$810 = 6P_b$

$135 = P_b$; ගැනුම්කරු ගෙවන මිල (ලකුණු 01යි)

(b) - සැපයුම්කරුවාට ලැබෙන මිල = ගැනුම්කරු ගෙවන මිල ($P_b$) + සහනාධාරය (ලකුණු 01යි)

- සැපයුම්කරුවාට ලැබෙන මිල = 135 + 15 = 150 (ලකුණු 02 යි)

(මුළු ලකුණු 06යි

**(සමීකරණ භාවිත නොකොට නිවැරදි ප්‍රස්තාර යොදා ගනිමින් නිවැරදි පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු ලබා දිය යුතු ය.))**

**04 වන ප්‍රශ්නය**

4. (i) අඩුවන පරිමාණානුකූල ඵල සහ විචල්‍ය සාධකයක හීනවන ඵල අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) "දැනට නීතිඥයෙකු ලෙස මසකට රු. 250 000ක වේතනයක් ලබමින් නීති උපදේශන සමාගමක සේවය කරන ජයන්ත, මසකට රු. 300 000ක් උපයා ගැනීමේ අපේක්ෂාවෙන් තමන්ගේ ම නීති උපදේශන ආයතනයක් ආරම්භ කිරීමට සලකා බලමින් සිටී. තමන්ගේ ම ආයතනයක් පවත්වාගෙන යාමට කාර්යාලයක් සහ ලිපිකරුවෙකු අවශ්‍ය වනු ඇත. ඔහු රු. 50 000ක මාසික කුලියකට කාර්යාලයක් ද සොයාගෙන ඇත. තව ද රු. 40 000ක මාසික වැටුපකට ලිපිකරුවෙකු ද කුලියට ගත හැකි වේ."

මෙම සංඛ්‍යා දත්ත නිවැරදි වේ නම්, ජයන්තගේ නීති උපදේශන ආයතනය ආර්ථික ලාභයක් උපයා ගැනීමට සමත් වේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) පූර්ණ තරගකාරී කර්මාන්තයක ප්‍රධාන ලක්ෂණ හතරක් අන්වන්න. (ලකුණු 04යි)

(iv) පූර්ණ තරගකාරී වී වෙළෙඳපොළක් උපකල්පනය කරන්න. වෙළෙඳපොළ තුළ සිටින නිෂ්පාදන ආයතන වී නිෂ්පාදනයෙහි යෙදී සිටිය ද දැනට ඔවුහු ආර්ථික අලාභ ලබමින් සිටිති.

(අ) මෙම තත්ත්වයට අදාළ වෙළෙඳපොළ වී මිල, ආයතනවල සාමාන්‍ය මුළු පිරිවැය (ATC), සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ ආන්තික පිරිවැය (MC) සමග සංසන්දනය කරන්න. (ලකුණු 03යි)

(ආ) පවත්නා තත්ත්වය වෙළෙඳපොළ තුළ සහ නිෂ්පාදන ආයතනය තුළ පිළිබිඹුවන ආකාරය එකිනෙකට යාබදව රූපසටහන් **දෙකක්** අඳිමින් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

04.(i) - අඩුවන පරිමාණානුකූල ඵල හටගන්නේ සියලු ම යෙදවුම් විචල්‍ය යෙදවුම් වශයෙන් පවත්නා දිගු කාලයේ දී ය. විචල්‍ය යෙදවුමක හීනවන ඵල හට ගන්නේ ස්ථාවර යෙදවුම් නොවෙනස් ව තබාගෙන විචල්‍ය යෙදවුම් පමණක් වැඩිකළ හැකි කෙටි කාලයේ දී ය.

(ලකුණු 02යි)

- අඩුවන පරිමාණානුකූල ඵල පෙන්නුම් කරනුයේ ස්ථාවර යෙදවුම් (කර්මාන්ත ශාලාවේ ධාරිතාව) වැඩි කරන විට කාර්යක්ෂමතාව වෙනස්වන ආකාරයයි. විචල්‍ය යෙදවුමක හීනවනඵල පෙන්නුම් කරනුයේ දෙන ලද ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමඟ විචල්‍ය යෙදවුමක් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ කාර්යක්ෂමතාව වෙනස් වන ආකාරයයි.

(ලකුණු 02යි)

(ii)- ආර්ථික ලාභය = මුළු අයභාරය - මුළු ආර්ථික පිරිවැය (ආවස්ථික පිරිවැය)

- මුළු අයභාරය = රු. 300,000
- මුළු පිරිවැය = ඍජු පිරිවැය + ආරෝපිත පිරිවැය

ඍජු පිරිවැය = බද්ද කුලිය + ලිපිකරු වේතනය

= 50,000 + 40,000 = 90,000

PAPERMASTER.LK

ආරෝපිත පිරිවැය - පෙර රැකියාවෙන් උපයාගත හැකිව තිබූ ආදායම (අහිමි වන වේතනය)
- රුපියල් 250,000

- මුළු පිරිවැය = 90,000 + 250,000 = 340,000

(ලකුණු 02යි)

- ආර්ථික ලාභය = මුළු අයභාරය - මුළු පිරිවැය
- ආර්ථික ලාභය = 300,000 - 340,000 = - 40,000
- මුළු අයභාරයට වඩා මුළු පිරිවැය වැඩි බැවින් ආර්ථික ලාභයක් උපයා ගැනීමට අසමත් වේ.

(ලකුණු 02යි)

(iii) **පූර්ණ තරගකාරී කර්මාන්තයක ප්‍රධාන ලක්ෂණ**
- ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.
- සමජාතීය භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම.
- අබාධ ප්‍රවේශය සහ පිටවීම.
- ගැනුම්කරුවන්ට සහ විකුණුම්කරුවන්ට වෙළෙඳපොළ පිළිබඳ පූර්ණ දැනුමක් තිබීම.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(iv) (අ)- වී වෙළෙඳපොළ තුළ සිටින ආයතන ආර්ථික අලාභ ලබමින් තවදුරටත් නිෂ්පාදනයෙහි යෙදී සිටී නම් ඔවුන්ගේ මුළු පිරිවැය වෙළෙඳපොළ මිලට වඩා ඉහළින් තිබිය යුතු ය.

(ලකුණු 01යි)


- ආර්ථික අලාභ ලබමින් තවදුරටත් නිෂ්පාදනයෙහි යෙදී සිටිනම් ඔවුන්ගේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වෙළෙඳපොළ මිලට වඩා පහළින් තිබිය යුතු ය. ඇතැම් විටක ආයතන තම සාමාන්‍ය විචල්‍ය පිරිවැය වෙළෙඳපොළ මිලට සමාන ව තිබියදීත් (වසා දමන ලක්ෂ්‍යය) නිෂ්පාදනයෙහි නිරත වී සිටිය හැකි ය. නුදුරු අනාගතයේ දී වෙළෙඳපොළ තත්ත්වය යහපත් අතට හැරේ යයි අපේක්ෂා කරන විට දී ය.

(ලකුණු 01යි)


- අලාභ ලබමින් වුවද නිෂ්පාදනයෙහි යෙදී සිටිනුයේ ලාභ උපරිමනය කිරීමේ (අලාභ අවමනය කිරීමේ) මූල ධර්මයට (MR = MC) අනුව බැවින් ආයතනවල ආන්තික පිරිවැය වෙළෙඳපොළ මිලට සමාන විය යුතු ය.

(ලකුණු 01යි)

(ආ) රූප සටහන




PAPERMASTER.LK




(වෙළෙඳපොළ දක්වෙන නිවැරදි රූපසටහනට ලකුණු 01යි. ආයතනය දක්වෙන නිවැරදි රූපසටහනට ලකුණු 02යි. ආර්ථික අලාභය නිවැරදි ව පෙන්නුම් කිරීමට ලකුණු 02යි. මුළු ලකුණු 05යි)

**05 වන ප්‍රශ්නය**

5. (i) නාමික දළ දේශීය නිෂ්පාදිතය, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සහ ප්‍රතිගීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

(ii) ආර්ථිකයක සිදුවන සමස්ත නිෂ්පාදන ක්‍රියාකාරකම් දළ දේශීය නිෂ්පාදිතය මගින් අධි තක්සේරු කෙරේ ද? නැතහොත් ඌන තක්සේරු කෙරේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) කුටුම්බයක් සඳහා පරිභෝජන ශ්‍රිතය පහත වගුව පෙන්නුම් කරයි.

| වැය කළ හැකි ආදායම (රු.) | පරිභෝජන වියදම (රු.) |
|---|---|
| 0 | 3 000 |
| 3 000 | 5 400 |
| 6 000 | 7 800 |
| 9 000 | 10 200 |
| 12 000 | 12 600 |
| 15 000 | 15 000 |
| 18 000 | 17 400 |

(අ) වැයකළ හැකි ආදායම රු. 9 000 දී සහ රු. 18 000 දී කුටුම්බයේ සාමාන්‍ය පරිභෝජන නැඹියාවන් (APC) සහ එම වැය කළ හැකි ආදායම පරාසයේ දී ආන්තික පරිභෝජන නැඹියාව (MPC) ගණනය කරන්න. (ලකුණු 04යි)

(ආ) කුටුම්බයේ පරිභෝජන සහ ඉතුරුම් ශ්‍රිත සඳහා සමීකරණ ලියන්න. (ලකුණු 04යි)

(ඉ) සපයා ඇති තොරතුරු ආශ්‍රයෙන්, කුටුම්බයේ පරිභෝජන සහ ඉතුරුම් ශ්‍රිත ප්‍රස්තාර කඩදාසියක් භාවිත කරමින් අඳින්න. (ලකුණු 05යි)

05.(i) - යම් නිශ්චිත කාලයක් (සාමාන්‍යයෙන් කාර්තුවක් හෝ වර්ෂයක්) තුළ කිසියම් රටක නිෂ්පාදනය කරනු ලන අවසාන භාණ්ඩ හා සේවාවල මුදල්මය වටිනාකම එම අවස්ථාවේ පැවැති මිල ගණන් යටතේ ඇස්තමේන්තු කළ විට, එය නාමික දළ දේශීය නිෂ්පාදිතය ලෙස දක්වේ.

(ලකුණු 01යි)

නැතහොත්

PAPERMASTER.LK

- යම් නිශ්චිත කාලයක් තුළ (සාමාන්‍යයෙන් වර්ෂයක් හෝ කාර්තුවක්) ආර්ථික ප්‍රදේශය තුළ සිටින සියලු ම නේවාසික ආයතනික ඒකක බිහි කළ එකතු කළ අගයන්ගේ සමස්තය පවත්නා මූලික මිල යටතේ ඇස්තමේන්තුකොට එයට භාණ්ඩ මත සහනාධාර අඩු කළ බදු

එකතු කළ විට එම වටිනාකම නාමික දළ දේශීය නිෂ්පාදිතය ලෙස දක්වේ.

(ලකුණු 01යි)

- මූර්ත දළ දේශීය නිෂ්පාදිතය යනු කිසියම් වර්ෂයක නාමික දළ දේශීය නිෂ්පාදිතය මිල මට්ටමේ වෙනස්කම් සඳහා ගැලපූ පසු ලැබෙන අගයයි.

(ලකුණු 01යි)

- ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය යනු නාමික හෝ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අදාළ රටේ මධ්‍ය වාර්ෂික ජනගහනයේ ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අගයයි.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)

(ii) අධි තක්සේරුවේ.

- කිසිවකු විසින් මිලක් නොගෙවන පරිසර දූෂණය, සත්ත්ව විශේෂයන්ට සිදුකෙරෙන හානි වැනි පාරිසරික බාහිරතා, දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් නොවේ.
- පරිසර දූෂණයේ හානිකර ප්‍රතිවිපාක, පරිසර දූෂණය අඩු කිරීම සඳහා දරනු ලබන පිරිවැය දළ දේශීය නිෂ්පාදිතයෙන් අඩු නොකෙරේ.
- සම්පත් සම්භාරය ක්ෂයවීම, ජෛව විවිධත්වය අහිමි වී යාම වැනි රටක වත්කම්වල වටිනාකමේ සිදුවන වෙනස්කම් දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යාවල ඇතුළත් නොවේ.
- යහපත් දෑ (goods) සහ අයහපත් දෑ (bads) යන දෙවර්ගයම දළ දේශීය නිෂ්පාදිතය සැලකිල්ලට ගනී. කිසියම් රටක භූමි කම්පාවක් හෝ සුනාමියක් හෝ හටගත් පසු සිදුවන නැවත ගොඩනැගීම් නිසා දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. කිසියම් පුද්ගලයකු රෝගී තත්ත්වයට පත් වූ විට එයින් සුවපත් වීමට දරන වියදම් නිසා දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. එහෙත් භූ කම්පන සිදුවීම හෝ ලෙඩ රෝග හට ගැනීම හෝ යහපත් දෑ ලෙස කිසිවකු නොසලකයි.

(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04යි)

ඌන තක්සේරු වේ.

- සංවිධානාත්මක නොවන වෙළෙඳපොළවල සිදුවන එලදායි ගනු දෙනු දළ දේශීය නිෂ්පාදිතය තුළ නොසලකා හැරේ. තම නිවාස තුළ පුද්ගලයන් ඉටුකරනු ලබන පිරිසිදු කිරීම්, කෑම පිළියෙළ කිරීම්, දරුවන් රැක බලා ගැනීම් වැනි ඉතා වටිනා සේවාවන් සැලකිල්ලට නොගැනේ.
- සැඟවුණු සහ නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන බොහෝ එලදායි ආර්ථික ක්‍රියාකාරකම් දළ දේශීය නිෂ්පාදිතය තුළ ප්‍රමාණවත්ව නිරූපණය නොවේ. නීති විරෝධීව සිදුවන භාණ්ඩ හා සේවා නිෂ්පාදිතයන්, බදු හා නියාමනයන්ගෙන් වැළැකී සිටීම සඳහා බලධාරීන් වෙත වාර්තා නොකෙරෙන ආර්ථික ක්‍රියා ඇතුළත් නොවේ.
- තාක්ෂණයේ ප්‍රතිලාභ සතුටුදායක ලෙස හසුකර ගැනීමට දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා අසමත් වී ඇත. අන්තර්ජාලය අපගේ එදිනෙදා ජීවිතයට ලබාදෙන පහසුකම් සහ ප්‍රතිලාභ නිල සංඛ්‍යා ලේඛන ප්‍රමාණවත් ලෙස පෙන්නුම් නොකරයි. අන්තර්ජාලය ඔස්සේ නොමිලයේ ලැබෙන සේවා සහ මෙවලම් (මාර්ග සිතියම්, සමාජ මාධ්‍ය ජාල, නිෂ්පාදිත තොරතුරු, විකිපීඩියා) ජාතික ගිණුම් වල ප්‍රමාණවත් ඇගැයීමකට ලක් නොවේ.

(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04යි)

PAPERMASTER.LK

(iii) (අ) රු. 9,000 ආදායම් මට්ටමේ දී සාමාන්‍ය පරිභෝජන නැඹියාව (APC)

$$APC = C/Y_d = 10200/9000 = 102/90 = 1.13$$

(ලකුණු 01යි)

- රු. 18,000 ආදායම් මට්ටමේ දී ඇස්තමේන්තු පරිභෝජන නැඹියාව

$$APC = C/Y_d = 17400/18000 = 174/180 = 0.97$$

(ලකුණු 01යි)

- රු. 9,000 - 18,000 ආදායම් පරාසයේ දී ආන්තික පරිභෝජන නැඹියාව

$$= (17400-10200)/(18000-9000) = 7200/9000$$

$$= 4/5 = 0.8$$

(ලකුණු 02යි)

(ආ) - කුටුම්බයේ පරිභෝජන ශ්‍රිතය : $C = a + bY_d$

ස්වායත්ත පරිභෝජනය (a) $= 3000$

ආන්තික පරිභෝජන නැඹියාව (b) $= 0.8$


- පරිභෝජන ශ්‍රිතය $= C = 3000 + 0.8Y_d$ (ලකුණු 02යි)
- කුටුම්බයේ ඉතුරුම් ශ්‍රිතය $S = -a + (1-b)Y_d$

$$S = -3000 + 0.2Y_d$$ (ලකුණු 02යි)

(ඉ) පරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිතය ප්‍රස්තාරයකින් දැක්වීම.

ඊළඟ පිටුව බලන්න.

PAPERMASTER.LK




(පරිභෝජන ශ්‍රිතය නිවැරදිව ඇඳ දැක්වීමට ලකුණු 03යි,
ඉතුරුම් ශ්‍රිතය නිවැරදිව ඇඳ දැක්වීමට ලකුණු 02යි,
මුළු ලකුණු 05යි.)

PAPERMASTER.LK

'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

**06 වන ප්‍රශ්නය**

6. (i) ආසන්න මුදල් සහ මුදල් ආදේශක අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) වර්තමානයේ ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ඉහළ උද්ධමනයට බලපා ඇති හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) පොලී අනුපාතිකය සහ මුදලට ඇති ඉල්ලුම අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව සතු විවිධ ශිල්පීය ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 07යි)

06.(i) - සල්ලි වශයෙන් නොගැනෙන එහෙත් ඉතා පහසුවෙන් සල්ලි බවට හරවාගත හැකි අතිශයින් ද්‍රවශීල වත්කම් ආසන්න මුදල් වශයෙන් සැලැකේ. වටිනාකමේ සන්නිධියක් වශයෙන් මුදලේ කාර්යය ඉටුකරන ඕනෑම දෙයක් ආසන්න මුදල් වශයෙන් සැලකිය හැකි අතර ඒවා කිසිසේත් හුවමාරු මාධ්‍යයන් නොවේ. (ලකුණු 01යි)

- කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමට ආසන්න වූ පිළිණපත්, ඇමෙරිකානු ඩොලර්, යූරෝ, යෙන් වැනි බහුල වශයෙන් ගනුදෙනු වන විදේශ මුදල් වර්ග ආසන්න මුදල්වලට උදාහරණ වශයෙන් දක්විය හැකි ය. (ලකුණු 01යි)

- අනෙක් අතට, මුදල් ආදේශක වශයෙන් සැලැකෙනුයේ වටිනාකම් සන්නිධියක් වශයෙන් මුදලේ කාර්යය ඉටු නොකෙරෙන එහෙත් හුවමාරු මාධ්‍යයක් වශයෙන් තාවකාලිකව යොදාගත හැකි දෑය. (ලකුණු 01යි)

- බැංකුවේ ජංගම ගිණුම මත ලියන ලද චෙක්පතක්, ණයපත්, බැරපත්, සංකේත කාසි (token Coins) සමකාලීනව දැකිය විවිධ ස්වරූපයේ විද්‍යුත් ණය, මුදල් ආදේශකයනට උදාහරණ වශයෙන් දක්විය හැකි ය. (ලකුණු 01යි)

(ii) - ඉන්ධන අර්බුදය, දේශගුණික විපර්යාස, කෝවිඩ් වසංගතය, යුක්‍රේන-රුසියානු යුද්ධය වැනි විවිධ හේතු නිසා විදේශීය හා දේශීය සැපයුම් දාමයන් බිඳ වැටීමෙන් ආහාර මිල ගණන් වල සිදු වූ ප්‍රබල ඉහළ යාම.

- අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තහනම් කිරීම, කෘෂිකාර්මික යෙදවුම් වල පිරිවැය ඉහළ යාම, රසායනික පොහොර භාවිතය තහනම් කිරීම, කඩිනමින් කාබනික පොහොර කරා මාරු වීමෙන් කෘෂි අස්වැන්න දැඩිලෙස පහළ වැටීම වැනි දේශීය ප්‍රතිපත්ති ව්‍යාකූලතා නිසා සැපයුම් දාම කඩා කප්පල් වීම තීව්‍රවීම.

- විශාල අයවැය පරතරයන් පියවනු පිණිස පොලී අනුපාතික පහළ හෙළමින් ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් රජය අනුගමනය කිරීම. 2019 දෙසැම්බර් මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම රු.ට්‍රිලියන 2.8කින් හෙවත් 42% කින් ඉහළ ගියේ ය.

- දෙවසරකට වැඩි කාලයක් තිස්සේ පැවැති කෝවිඩ් - 19 වසංගතයත් වැරදි ආර්ථික කළමනාකරණයත් හේතුවෙන් විශාල විදේශ විනිමය හිඟයකට ආර්ථිකය මුහුණ දීම සහ එහි ප්‍රතිඵල වශයෙන් ආහාර, ඉන්ධන, පොහොර, ඖෂධ වැනි අත්‍යවශ්‍ය ආනයන ලබා

PAPERMASTER.LK

ගැනීමට අපහසු වීම.

- **විනිමය අනුපාතිකය ක්ෂයවීම :** 2022 මාර්තු මාසයේ දී විනිමය අනුපාතිකය පාවීමට ඉඩහළ පසුව මාස දෙකක් ඇතුළත ඇමෙරිකානු ඩොලරය රු. 365ක් දක්වා ඉහළ ගියේ ය. මාස දෙකක් ඇතුළත 80%කින් විනිමය අනුපාතිකයේ ක්ෂයවීම 100%කට වඩා වැඩි ප්‍රමාණයකින් ආහාර උද්ධමනය ඉහළ යාමට ප්‍රබල දායකත්වයක් සැපයී ය.

- **සමස්ත ආර්ථිකය සංකෝචනය වීම :** මෑත වර්ෂවල ආර්ථිකය දැඩි සංකෝචනයට පාත්‍රවීම ද උද්ධමන ප්‍රවණතා ශක්තිමත් වීමට බලපා ඇත.

ආර්ථික වෘද්ධි අනුපාතිකය :
- 2020 -3.6%
- 2021 3.3%
- 2022 -8.8%

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

(iii) - මුදලට ඇති ඉල්ලුම පැහැදිලි කෙරෙන සමපේක්ෂණ චේතනාවට අනුව පොලී අනුපාතිකය සහ මුදලට ඇති ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී.

**(ලකුණු 01යි)**

- පොලී අනුපාතික පහළ බසින විට වත්කමක් වශයෙන් මුදල් ශේෂ සඳහා කරන ඉල්ලුම ඉහළ නගී. පිළිණපත් මිල පොලී අනුපාතිකය සමඟ ප්‍රතිලෝම සම්බන්ධයක් පෙන්නුම් කරයි. පොලිය ඉහළ ගිය විට පිළිණපත් මිල පහළ අගයක් ගන්නා අතර පොලිය පහළ බසින විට පිළිණපත් මිල ඉහළ අගයක් ගනී.

**(ලකුණු 01යි)**

- පිළිණපත් මිලෙහි හටගන්නා මෙම විචලනය නිසා පිළිණපත් මිල අඩුවෙන් පවතින අවස්ථාවල දී (එනම් පොලී අනුපාතිකය ඉහළින් පවතින විට) පිළිණපත් මිලට ගැනීමත් සහ පිළිණපත් මිල ඉහළින් පවතින විට (එය පොලී අනුපාතික පහළ අගයක් ගන්නා විට) ඒවා අලෙවි කිරීමත් මගින් පිළිණපත් හිමියන්ට ප්‍රාග්ධන ලාභ උපයාගත හැකි ය.

**(ලකුණු 01යි)**

- කෙසේ වෙතත් මුදල් ළඟ තබාගන්නා විට දක්නට නොමැති අවදානමක් පිළිණපත් ළඟ තබා ගන්නා විට දැකිය හැකි ය. එබැවින් අනාගත පොලී අනුපාතික පහළ වැටේ යයි අපේක්ෂා කරන පුද්ගලයන් ඒ සමඟම අනාගත පිළිණපත් මිල වැඩිවේ යයි අපේක්ෂා කරන අතර එමගින් ප්‍රාග්ධන ලාභ උපයා ගැනීමේ අරමුණින් වර්තමානයේ මුදල් ශේෂ ළඟ තබා ගැනීමට කරන ඉල්ලුම අඩුකොට පිළිණපත් වැඩි වැඩියෙන් මිලට ගනී. අනික් අතට අනාගතයේ පොලී අනුපාතිකය ඉහළ යතියි අපේක්ෂා කරන්නේ නම්, වර්තමානයේ පිළිණපත් මිලයට නොගෙන තිබෙන පිළිණපත් පවා අලෙවිකොට මුදල් ශේෂ සඳහා ඉල්ලුම වැඩි කරනු ලැබේ.

**(ලකුණු 01යි)**

- මුදල් ශේෂ ළඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය ලෙස පොලී අනුපාතිකය සැලකේ. එබැවින් පොලී අනුපාතිකය ඉහළ යන විට මුදල් ශේෂ ළඟ තබා ගැනීමේ පිරිවැය ඉහළ නගී. මේනිසා පොලිය ඉහළ යන විට මුදලට ඇති ඉල්ලුම අඩු කරනු ලැබේ.

PAPERMASTER.LK

**(ලකුණු 01යි)**

**(මුළු ලකුණු 05යි)**

(iv) - මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව සතුව පුළුල් පරාසයක පැතිරුණු ශිල්පීය ක්‍රම සමුදායක් ඇත.
- ප්‍රතිපත්ති පොලී අනුපාතික
- විවට වෙළෙඳපොළ කටයුතු
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
- බැංකු පොලිය
- ප්‍රතිමූල්‍ය පහසුකම්
- ණය පිළිබඳ ප්‍රමාණාත්මක සීමා කිරීම්
- පොලී අනුපාතික පිළිබඳ උපරිම සීමා නියම කිරීම
- ණයවර ලිපි සඳහා ආන්තික අවශ්‍යතා නියම කිරීම
- විදේශ විනිමය මෙහෙයුම්
- ණය මත වටිනාකමේ අනුපාත පැනවීම
- ශිෂ්ඨ ප්‍රයෝග

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතකට ලකුණු 07යි)**

**07 වන ප්‍රශ්නය**

7. (i) පහත සඳහන් භාණ්ඩ පොදු භාණ්ඩ, සුබසාධන භාණ්ඩ සහ අවගුණ භාණ්ඩ යන කවර ගණයකට අයත් වේ දැයි වර්ගකොට දක්වන්න.
(අ) ගුවන්විදුලි සම්ප්‍රේෂණ (ආ) එන්නත් කිරීම
(ඉ) සිගරට් (ඊ) කෞතුකාගාර (ලකුණු 04යි)

(ii) සෘජු සහ වක්‍ර බදුවල සාපේක්ෂ වාසි සහ අවාසි සසඳන්න. (ලකුණු 04යි)

(iii) (අ) බදු ආපාතය යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 02යි)
(ආ) නෛතික බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(iv) පරිභෝජනයේ ඍණ බාහිරතාවක් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව කෙරෙහි බලපානු ලබන්නේ කෙසේ ද? රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

07. (i) - (අ) ගුවන් විදුලි සම්ප්‍රේෂණ - පොදු භාණ්ඩ
(ආ) එන්නත් කිරීම් - සුබ සාධන භාණ්ඩ
(ඉ) සිගරට් - අවගුණ භාණ්ඩ
(ඊ) කෞතුකාගාර - සුබ සාධන භාණ්ඩ / අශුද්ධ පොදු භාණ්ඩ (ලකුණු 04යි)

(ii)

| සෘජු බදු | |
|---|---|
| වාසි | අවාසි |
| 1. වඩාත් සාධාරණ වේ. බදු ගෙවීමේ හැකියාව ඇති අය මත පමණක් පතිත වේ. අනුක්‍රමණික නැඹුරුවක් පවතී. | 1. වැඩ කිරීමට ඇති උනන්දුව සහ ව්‍යාපාර පවත්වා ගැනීම අධෛර්යමත් කරයි. බුද්ධි ගලනය දිරිමත් කෙරේ. |
| 2. බදු ආපාතය නිර්ණය කිරීම වඩා පහසු ය. විතැන් කිරීම දුෂ්කර වේ. | 2. පුද්ගලයන්ගේ සහ සමාගම්වල ඉතුරුම් අධෛර්යමත් කෙරේ. |
| 3. එකතු කිරීම පහසු ය. උදා : PAYE බද්ද බොහෝ වැටුප් උපයන්නන්ගෙන් එකතු කරගනු ලබන ආදායම් බද්දකි. * ආර්ථික ක්‍රියාකාරකම් විකෘති කරයි. | 3. බදු වලින් පලායාම සහ බදු ගෙවීමෙන් වැළැකී සිටීම ධෛර්යමත් කෙරේ. |
| 4. ඉල්ලුම් කළමනාකරණය කෙරෙන රජයේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සඳහා වඩාත් ප්‍රයෝජනවත් වේ. | 4. බදු ගෙවීමේ දී තේරීමක් කිරීමට (බද්ද ගෙවනවාද නැද්ද වශයෙන්) අවස්ථාවක් නැත. බදු ගෙවීම නොවැළැක්විය හැකි ය. - ආර්ථික වර්ධනය හීනවේ. |

PAPERMASTER.LK

(වාසි දක්වෙන එක් කරුණකට ලකුණු 01යි, අවාසි දක්වෙන එක් කරුණකට ලකුණු 01යි.
මුළු ලකුණු 02යි)

| වක්‍ර බදු | |
|---|---|
| වාසි | අවාසි |
| 1. වක්‍ර බද්දක බදු ආපාතය නිර්ණය කිරීම පහසු ය. | 1. වක්‍ර බදු ප්‍රති ක්‍රම බදු ස්වරූපයකි. ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට දිළිඳු ජන කොටස් මත වැඩි බරක් පතිත වේ. |
| 2. ඇතැම් පරිභෝජන ක්‍රියා අධෛර්යමත් කිරීමට යොදා ගත හැකි ය. උදා : මත්පැන්, දුම්කොළ | 2. එකතු කර ගැනීම දුෂ්කර සහ පිරිවැය අධික කටයුත්තකි. |
| 3. අනම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩ මත වක්‍ර බදු පැනවීමෙන් බදු අයභාරය පහසුවෙන් වැඩිකර ගත හැකි ය. | 3. ලබාගත හැකි අයභාරය පහසුවෙන් පුරෝකථනය කිරීම දුෂ්කර ය. |
| 4. වැඩකිරීමට ඇති උනන්දුව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොවේ. | 4. උද්ධමනයට සෘජු දායකත්වයක් සපයයි.<br>- වෙළඳපොළ විකෘතිතා ඇතිකරයි. |

(වාසි දක්වෙන එක් කරුණකට ලකුණු 01යි, අවාසි දක්වෙන එක් කරුණකට ලකුණු 01යි.
මුළු ලකුණු 02යි)

(iii) (අ) - බදු ආපාතය යන්නෙන් අදහස් කරනුයේ බද්දක සෘජු මූල්‍ය බදු බර අවසාන වශයෙන් පතිත වන ස්ථානයයි. එය බදු විතැන් කිරීමේ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය ද වේ. එම පුද්ගලයා මත බදු බර අවසාන වශයෙන් පතිත වූ පසු තවදුරටත් බදු බර විතැන් කිරීමේ හැකියාවක් නොමැත. අවසාන බදු බර ආර්ථිකයේ විවිධ කණ්ඩායම් අතර බෙදී යාමට ද පිළිවන.

(ලකුණු 02යි)

(ආ) - නෛතික බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය වශයෙන් බදු ආපාතයේ ස්වරූප දෙකකි. භෞතික වශයෙන් රජයට බද්ද ගෙවීම සඳහා නීතියෙන් බැඳී සිටින පුද්ගලයන් හෝ සමාගම් විසින් ගෙවනු ලබන බදු ප්‍රමාණය නීතිමය බදු ආපාතය වේ. ආර්ථික බදු ආපාතය යන්නෙන් අදහස් කෙරෙනුයේ කිසියම් බද්දක් නිසා අවසාන වශයෙන් සමාජයේ ආර්ථික සුබ සාධනය මත ඇති කරනු ලබන ප්‍රතිඵලයයි. (ලකුණු 02යි)

- නෛතික බදු ආපාතය ආර්ථික බදු ආපාතයෙන් වෙනස් වන ප්‍රමාණය රඳා පවතිනුයේ බදු බර විතැන් කිරීමට ඇති හැකියාව මත ය. බදු බර කිසිසේත් විතැන් කළ නොහැකි විට නීතිමය බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය අනන්‍ය වේ. (ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

(iv) - පරිභෝජනයේ සෘණ බාහිරතාවක් හටගත හැක්කේ කිසියම් භාණ්ඩයක පරිභෝජනය තුන්වන පාර්ශ්වයක් මත හානිකර බලපෑමක් ඇති කරන විට දී ය. උදාහරණයක් වශයෙන් කිසියම් පුද්ගලයෙක් මැදියම් රැයෙහි ඝෝෂාකාරී ලෙස සංගීතය භුක්ති විඳින හෝ තමන් අවට සිටින පුද්ගලයන්ට අහිතකර බලපෑමක් ඇතිවන ලෙස දුම්පානය කිරීම හෝ දැක්විය හැකි ය. මෙම අවස්ථාවන්හි පරිභෝජනයේ සමාජ ප්‍රතිලාභය පෞද්ගලික ප්‍රතිලාභයට වඩා අඩු ය.


PAPERMASTER.LK

(ලකුණු 02යි)

- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් පරිභෝජනය කිරීමේ දී සෘණ බාහිරතා හටගනී නම් එය වෙළෙඳපොළ අසමත් වීමක් පෙන්නුම් කරයි. මක්නිසාදයත් එම පාරිභෝගිකයා තම පරිභෝජන ක්‍රියාව නිසා අන්‍යයන් මත ඇති කරන පිරිවැය සැලකිල්ලට නොගනී. බාහිර පිරිවැය නොසලකමින් පෞද්ගලික ප්‍රතිලාභය පමණක් සැලකිල්ලට ගෙන තීරණ ගන්නා විට වෙළෙඳපොළ පරිභෝජන මට්ටම (නිමැවුම් ප්‍රමාණය) සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජන මට්ටමට (නිමැවුම් ප්‍රමාණය) වඩා බෙහෙවින් අධික වේ. මෙම අධි පරිභෝජන (අධි නිෂ්පාදනය) තත්ත්වය සම්පත් භාවිතයේ අකාර්යක්ෂමතාව (අහිමි වන සුබ සාධනය) පිළිබිඹු කරයි.

(ලකුණු 02යි)

- මෙම තත්ත්වය පහත රූප සටහන පෙන්නුම් කරයි.




සෘණ බාහිරතා සහිත භාණ්ඩයේ නිදහස් වෙළෙඳපොළ පරිභෝජන මට්ටම (නිමැවුම් ප්‍රමාණය) $Q_1$ වන අතර එම පරිභෝජන මට්ටමෙහි සමාජ ආන්තික ප්‍රතිලාභ $P_3$ වන නමුත් එහි සමාජ ආන්තික පිරිවැය $P_1$ වේ. සමාජයීය වශයෙන් කාර්යක්ෂම හා ප්‍රශස්ත නිමැවුම් මට්ටම වනුයේ සමාජ ආන්තික ප්‍රතිලාභ සහ සමාජ ආන්තික පිරිවැය සමාන කෙරෙන $Q_2$ නිමැවුම් ප්‍රමාණයයි. ABC ත්‍රිකෝණය අහිමිවන සුබ සාධනය පෙන්නුම් කරයි. .

(නිවැරදි රූපසටහනට ලකුණු 01යි, අහිමිවන සුබ සාධන ත්‍රිකෝණය නම් කිරීමට ලකුණු 01යි)
(මුළු ලකුණු 06යි)

PAPERMASTER.LK

**08 වන ප්‍රශ්නය**

8. (i) රටක සාපේක්ෂ වාසි නිර්ණය කෙරෙන සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
(ii) ගෙවුම් ශේෂ ප්‍රකාශනයක ඇතුළත් ප්‍රධාන ගිණුම් සහ අයිතම කවරේ ද? (ලකුණු 04යි)
(iii) කලාපීය වෙළෙඳ ගිවිසුමක් සහ ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුමක් අතර වෙනස ශ්‍රී ලංකාව ඇසුරින් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)
(iv) "2000 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 30%ක්ව පැවති අපනයන අනුපාතය 2020 වනවිට 14.8% දක්වා අඩකින් ම පහළ වැටිණි." මෑත දශකවල දී ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ දුබල සාධන මට්ටමට බලපා ඇති හේතු පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

08. (i)
- ස්වභාවික සම්පත් වල ප්‍රමාණය සහ ගුණාත්මක තත්ත්වය
- ප්‍රජා විද්‍යාත්මක සාධක (සංක්‍රමණය වීම්, අධ්‍යාපනය උසස් වීම, ශ්‍රම හමුදාව තුළ කාන්තා සහභාගීත්වය)
- යටිතල පහසුකම් ඇතුළු ප්‍රාග්ධන ආයෝජන
- වැඩිවන පරිමාණානුකූලඵල සහ ශ්‍රමික විභාජනය
- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය තුළ ආයෝජනය
- රාජ්‍ය ප්‍රතිපත්ති (බදු, සහනාධාර, විනිමය අනුපාතික)
- ආයතන (බැංකු පද්ධතිය, නීති පද්ධතිය, දේශපාලනික ආයතන, ප්‍රජාතන්ත්‍රවාදයේ ස්ථාවරත්වය)
- භූගෝලීය පිහිටීම (දේශගුණය හා භූගෝලීය ලක්ෂණ)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(ii)
- ජංගම ගිණුම (ලකුණු 01යි)
  - භාණ්ඩ
  - සේවා
  - ප්‍රාථමික ආදායම්
  - ද්විතීයික ආදායම්
- ප්‍රාග්ධන ගිණුම (ලකුණු 01යි)
- මූල්‍ය ගිණුම (ලකුණු 01යි)
  - සෘජු ආයෝජන
  - විවිධ ආයෝජන (කළඹ ආයෝජන)
  - වෙනත් ආයෝජන
  - සංචිත වත්කම්

(ජංගම ගිණුමේ හෝ මූල්‍ය ගිණුමේ අයිතමයන් දක්වා ඇත්නම් ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(iii) - ද්විපාර්ශවීය වෙළෙඳ ගිවිසුමක් යනු රටවල් දෙකක් අතර වාසිදායක වෙළෙඳ රටාවක් ඇතිකර ගැනීම උදෙසා සකසා ගනු ලබන ගිවිසුමකි. මේ මගින් එකිනෙකාගේ වෙළෙඳපොළ තුළට ප්‍රවේශවීමට අවස්ථාව උදා වන බැවින් එය දෙරටේ ම වෙළෙඳාමේ වර්ධනයට සහ ආර්ථිකයේ වර්ධනයට හිත කර වේ. ගිවිසුමේ කොන්දේසි මගින් වෙළෙඳාම සඳහා අදාළ ක්ෂේත්‍ර සහ තරඟ කිරීමට යෝග්‍ය සමබිමක් (level piaying field) තීරණය කෙරේ.

(ලකුණු 02යි)

PAPERMASTER.LK

- උදාහරණ
    - ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම
    - ශ්‍රී ලංකා - පකිස්ථාන නිදහස් වෙළෙඳ ගිවිසුම
    - ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම

(උදාහරණයක් සඳහා ලකුණු 01යි)

- සාමාජික රටවල් අතර නිදහසේ භාණ්ඩ හා සේවා ගලායාම ධෛර්යමත් කිරීම උදෙසා නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් තුළ සිටින රටවල් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් එකතු වී අත්සන් කරනු ලබන ගිවිසුමක් කලාපීය වෙළෙඳ ගිවිසුමක් ලෙස සැලැකේ. සාමාජික රටවල් අතර වෙළෙඳ බාධක ඉවත් කර ගැනීමට අදාළ කොන්දේසි ගිවිසුමෙහි ඇතුළත් කෙරේ. එසේම සාමාජික නොවන රටවල් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයන් ද සඳහන් කෙරේ.

(ලකුණු 02යි)

- උදාහරණ :
    - දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ප්‍රදේශය (SAFTA)
    - ආසියා - ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA)
    - සාක් කලාපීය වරණීය වෙළෙඳ ගිවිසුම (SAPTA)

(උදාහරණයක් සඳහා ලකුණු 01යි)

(iv) - අපනයන නිෂ්පාදිතයන්ගේ විවිධාංගකරණය අතිශයින් සීමිත වීම. 1990 ගණන් මැද භාගයේ සිටම අප රටේ අපනයන සංයුතිය බොහෝ සෙයින් ස්ථාවරව පැවත තිබේ. ඇඟලුම්, තේ, රබර් වැනි සාම්ප්‍රදායික නිෂ්පාදිත කීපයකින් ඔබ්බට විවිධාංගකරණය කොට නොමැත.

- අපනයන වෙළෙඳපොළවල විවිධාංගකරණයක් දක්නට නොතිබීම : මුළු අපනයන වලින් 2/3 ක් පමණ යොමුව ඇත්තේ යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතය. තවද තේ අපනයන වලින් 70% ක් පමණ යොමුව ඇත්තේ මැද පෙරදිගට සහ ස්වාධීන රාජ්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයටය.

- අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා ආයෝජනය සීමිත වීම : නැගෙනහිර ආසියාවේ නව කාර්මික රටවල අපනයන අංශයේ ශීඝ්‍ර වර්ධනයට දායක වූයේ අපනයනාභිමුඛ සෘජු විදේශ ආයෝජනයන්ය. එහෙත් ශ්‍රී ලංකාව සෘජු විදේශ ආයෝජන මෙම ක්ෂේත්‍රයට යොමු කරවා ගැනීමට අසමත්ව ඇත.

- සරල තාක්ෂණය මත පදනම් වූ අපනයන කර්මාන්තය : අප රටේ ඇත්තේ ඉතා පහළ මට්ටමේ තාක්ෂණය හා ශිල්පඥානය පදනම් කරගත් අපනයන කර්මාන්තයන්ය. බටහිර රටවල් එවැනි තාක්ෂණය අත්හැර දමා ඉහළ තාක්ෂණය කරා යොමු වන විට ශ්‍රී ලංකාව තව දුරටත් එවැනි සරල තාක්ෂණයන්හිම එල්බ සිටී.

- වර්තමානයේ ප්‍රධාන අපනයන කර්මාන්තයන්හි ඵලදායිතාව ඉහළ යාමට වඩා වැඩි වේගයකින් සිදුවන වැටුප් ඉහළ යාමේ ගැටලුවද මුහුණ දී සිටී.

- තේ අපනයන ක්ෂේත්‍රයේ ඵලදායිතාව අඩු වීම සහ පිරිවැය ඉහළ යාම : ශ්‍රම සූක්ෂ්ම තාක්ෂණය පදනම් කරගත් නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැය ඉතා අධිකය. පැරණි තේ ගස් අඩුඵලදාවක් ලබා දෙයි. තරඟකාරී රටවල් සමග සසඳන විට ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ පිරිවැය ඉහළ යාම ප්‍රධාන ගැටලුවකි.

PAPERMASTER.LK

- ශ්‍රම හමුදාව අඩුවීම සහ ශ්‍රම පිරිවැය ඉහළ යාම ; තේ වතුවලට අවශ්‍ය කරන ශ්‍රමය රඳවා ගැනීම විශාල අභියෝගයක් වී ඇත. තේ කම්කරුවන්ගේ අඩු සමාජ තත්ත්වය, තරුණ පරපුර අධ්‍යාපනය ඉහළ නංවා ගැනීම නිසා වතු අංශයට යොමු නොවීම, තේ වතු වලින් පරිබාහිරව වඩා ආකර්ශණීය රැකියා අවස්ථා පැවැතීම මෙහිලා බලපා ඇත.

- ශ්‍රී ලංකාව විසින් මෙතෙක් අත්සන් කොට ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ විවෘත වී ඇති වෙළෙඳපොළ අවස්ථා කාර්යක්ෂම ව උපයෝජනය කර ගැනීමට අසමත් වීම.

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 07යි)**

**09 වන ප්‍රශ්නය**

9. (i) ආර්ථික සංවර්ධනය සහ මානව සංවර්ධනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) දරිද්‍රතා රේඛාව සහ ජනගහන දරිද්‍රතා දර්ශකය අතර වෙනස කුමක් ද? (ලකුණු 04යි)

(iii) වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් ආර්ථික වශයෙන් සක්‍රිය නොවිය හැක්කේ කවර හේතු නිසා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) සමාජ ආරක්ෂණ ජාලයක් යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක කෙරෙන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල දක්නට ඇති අඩුපාඩු කවරේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 06යි)

09. (i) - ආර්ථික සංවර්ධනය සහ මානව සංවර්ධනය එකිනෙකට බැඳුණු සංකල්ප වන අතර ඒ දෙකෙන් ම කරනුයේ ආර්ථික ධනය සහ මානව සුබ සාධනය යන පැතිකඩ ඔස්සේ රටක සමස්ත සංවර්ධනය මිනුම් කිරීම ය. මානව සංවර්ධනය බොහෝ සෙයින් මිනිසුන්ගේ යහපැවැත්ම අවධාරණය කරන අතර ආර්ථික සංවර්ධනය පුළුල් ක්ෂේත්‍රයක පැතුරුණු සමාජ ආර්ථික සාධක අවධාරණය කරයි.

- මානව සංවර්ධනය වූ කලී පුද්ගලයාගේ නිදහස, ඔහු හමුවේ ඇති අවස්ථාවන් (opportunities) සහ යහපැවැත්ම අඛණ්ඩ ව ඉහළ නංවන ක්‍රියාවලියකි. 1970 ගණන් වල දී මෙම සංකල්පය ඉදිරිපත් කරනු ලැබුවේ දළ දේශීය නිෂ්පාදිතය හෝ ආර්ථික වෘද්ධිය හෝ මානව සංවර්ධනය මිනුම් කිරීමෙහි ලා සාධාරණයක් නොකරන බව පෙනී ගිය බැවිනි.

- මිනිසුන්ට යහපත් සෞඛ්‍ය තත්ත්වයක්, අධ්‍යාපනය සඳහා යහපත් ප්‍රවේශයක් සහ යහපත් ජීවන තත්ත්වයක් තිබිය යුතු බව මානව සංවර්ධන සංකල්පය විශ්වාස කරයි. මානව සංවර්ධන දර්ශකය මගින් මානව සංවර්ධනය මිනුම් කෙරේ. මානව සංවර්ධනයට අදාළ සෙසු මිනුම් ලෙස මානව දරිද්‍රතා දර්ශකය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සවිබල ගැන්වීමේ මිනුම සැලකිය හැකි ය.

- ආර්ථික සංවර්ධනය පුළුල් සංකල්පයක් වන අතර එහි ද ගුණාත්මක පැතිකඩ සමූහයක් ඇත. ආර්ථික වෘද්ධියට අමතර ව යහපත් ජීවන තත්ත්වයක් ඇතිකර ගැනීමට අවශ්‍ය කරන වැදගත් විචල්‍ය රාශියක ධනාත්මක වෙනස්කම් රැසක් එයින් අදහස් කෙරේ. මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම, ජීවන තත්ත්වය ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය, ආර්ථික වෘද්ධිය, ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම්, ජාත්‍යන්තර වෙළෙඳාමේ වර්ධනය, පාරිසරික සෞඛ්‍යය, සෞඛ්‍ය හා ආයු අපේක්ෂාව උසස් කිරීම වැනි කරුණු රැසක් ආර්ථික සංවර්ධනය තුළට ඇතුළත් වේ.

PAPERMASTER.LK

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම වෙනසකම් දෙකකට ලකුණු 04යි)**

(ii) - දරිද්‍රතා රේඛාවෙන් පෙන්නුම් කරනුයේ ආහාර, වාසස්ථාන වැනි මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පුද්ගලයෙකුට මාසයකට අවශ්‍යකරන මුදල් ප්‍රමාණයයි.

- ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව ඇස්තමේන්තු කරනුයේ මූලික අවශ්‍යතා සඳහා වැයවන පිරිවැය ක්‍රමය පදනම් කරගෙන ය. එහි දී පුද්ගලයෙකුට අවශ්‍යකරන අවම කැලරි ප්‍රමාණය ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රමාණය ආහාර දරිද්‍රතා රේඛාව යටතේ ගණනය කෙරේ. ඉන්පසු නිවාස, ඇඳුම් සහ ප්‍රවාහනය වැනි ආහාර නොවන අත්‍යවශ්‍ය වියදම් ගණනය කොට ආහාර දරිද්‍රතා රේඛාවේ අගයට එකතු කොට ජාතික දරිද්‍රතා රේඛාවේ අගය ගණනය කෙරේ.

(ලකුණු 02යි)

- දරිද්‍රතා රේඛාවට පහළ ආදායමක් ලබන පුද්ගලයන්ට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි බැවින් ඔවුන් දිළින්දන් වශයෙන් සැලැකේ. මෙලෙස ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින ජන සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කළ විට එය ජනගහන දරිද්‍රතා දර්ශකය නමින් හැඳින් වේ.

(ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

(iii) ආර්ථික වශයෙන් සක්‍රිය නොවීමට හේතු :
- පූර්ණ කාලීන ව කුටුම්බයේ කටයුතුවල නිරත වීම.
- පූර්ණ කාලීන ශිෂ්‍යයන් වීම.
- විශ්‍රාමික හෝ වියපත් වීම.
- දීර්ඝ කාලීන රෝගී තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය
- කිසියම් හෝ හේතුවක් නිසා සේවා නියුක්ත වීමට කැමැත්තක් නොදක්වන පුද්ගලයන්

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හතරකට ලකුණු 04යි)

(iv)(අ) - සමාජ ආරක්ෂණ ජාල යනුවෙන් අදහස් කරනුයේ දිළින්දන්, වියපත්වූවන්, ආබාධිතයන්, ළමයින්, කාන්තාවන්, අවතැන්වූවන් වැනි අනාරක්ෂිත සහ අවදානම් තත්ත්වයක පසුවන ජනකොටස්වල ජීවන තත්ත්වය උසස් කර ගැනීමට උපකාර කරනු පිණිස දායකත්ව ගෙවීමකින් තොරව ක්‍රියාත්මක වන වැඩසටහන් ය.

(ලකුණු 01යි)

- දරිද්‍රතාව, අවදානම්කාරී තත්ත්වය, අසමානතාව, සමාජීය බැහැර කිරීම් (Social Exclusion) වැනි ගැටලු ආමන්ත්‍රණය කිරීමට වඩාත් යෝග්‍ය මෙවලමක් වශයෙන් සමාජ ආරක්ෂණ ජාල වර්තමානයේ ඉහළ පිළිගැනීමකට ලක්ව ඇත. මුදල් සහ භාණ්ඩ ප්‍රදානයන්හි සිට විශ්‍රාමික දීමනා, රක්ෂණ සේවා, ජීවනෝපාය සංවර්ධනය වැනි විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

(ලකුණු 01යි)

(ආ) - සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් විශාල සංඛ්‍යාවක් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වුවද ඒවායේ විවිධ සීමාවන් අඩුපාඩු දක්නට ලැබේ.

- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බොහෝ සමාජ ආරක්ෂණ වැඩසටහන් වල දක්නට ලැබෙන ඉතා පොදු ගැටලුවක් වන්නේ ඒවා මගින් ආවරණය කෙරෙන පිරිස කුඩා වීමත් ඉලක්ක ගත නොවීමත් ය. දිළින්දන්, වියපත් වූවන් සහ ආබාධිතයන් ඉලක්ක කොට ක්‍රියාත්මක වන වැඩසටහන් තුළට ප්‍රවේශ වී ඇත්තේ ඒ සඳහා හිමිකම් ඇත්තවුන්ගෙන් ඉතා කුඩා ප්‍රතිශතයකි.

- විශාලතම සමාජ ආරක්ෂණ වැඩසටහන වන සමෘද්ධි වැඩසටහන ඉලක්ක ගත කිරීම අනික් ප්‍රබල පසුබෑමක් පෙන්නුම් කරයි. මෙම වැඩසටහන කෙරෙහි ප්‍රාදේශීය දේශපාලන නායකත්වය දැඩි බලපෑමක් ඇති කරයි. පහළ මට්ටමේ කටයුතු කරන ක්ෂේත්‍ර නිලධාරීන් බහුතරයක් දේශපාලනික පත්වීම් ලබාගත් අය බැවින් ප්‍රතිලාභීන් තේරීමේ දී දැඩි දේශපාලනික අභිනතියක් පෙන්නුම් කෙරේ. මැතිවරණවල දේශපාලනික පක්ෂපාතිත්වය දැක්වූ පාක්ෂිකයනට ප්‍රතිඋපකාර වශයෙන් සමෘද්ධි ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.

- අයවැය සංරෝධක හමුවේ සම්පත් බෙදීයාම දැඩි අසමානතාවන්ට ලක්ව ඇත. බොහෝ වැඩසටහන් වලින් ලබාදෙන මූල්‍ය සංක්‍රාම අතිශයින් කුඩා ප්‍රවාහයක් වන බැවින් ජීවන තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට ඒවා ප්‍රමාණවත් නොවේ. සම්පත් සංරෝධකයන් නිසා ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමට හෝ ප්‍රතිලාභවල ප්‍රමාණය වැඩි කිරීමට හෝ අවස්ථාවක් නැත.

- සමාජ ආරක්ෂණ වැඩසටහන් අතර සම්බන්ධීකරණය දුර්වලවීම ඒවායේ කාර්යක්ෂමතාවට හානි කර වී ඇත. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා වැනි විවිධ රාජ්‍ය ආයතන මගින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නගා ඇති බැවින් එක් අතකින් පිරිවැය ඉහළ යාමත් තවත් අතකින් ප්‍රතිලාභ අවභාවිත වීමක් සිදු වේ.

- බොහෝ වැඩසටහන් වල ප්‍රවේශ වීමට සහ ඉවත්ව යාමට අදාළ නිර්ණායක නිශ්චිත ව හඳුනා ගැනීමෙන් සම්පත් භාවිතය අකාර්යක්ෂම වී ඇත.

- සමෘද්ධි වැඩසටහනේ සුබසාධන ප්‍රවේශය FAO වැනි ජාත්‍යන්තර සංවිධානවල දැඩි විවේචනයට ද පාත්‍ර වී ඇත. සමෘද්ධි වැඩසටහන ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ ආර්ථික සංවර්ධනයට අත දෙනවා වෙනුවට ඔවුන් සුබසාධන ප්‍රවේශයක් ඔස්සේ යැපුම් මානසික තත්ත්වයකට පත්කොට ඇති බව එම ආයතනයේ අදහස.ය. එබැවින් එවැනි වැඩසටහන් දිගුකාලීනව පවත්වාගෙන යාම ද විශාල අභියෝගයක් වනු ඇත.

(එක් දුර්වලතාවකට ලකුණු 02 බැගින් ඕනෑම දුර්වලතා තුනකට ලකුණු 06යි)

PAPERMASTER.LK

**10 වන ප්‍රශ්නය**

10. (i) රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04යි)

(ii) ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා ක්‍රියාවට නැංවීමට අත්‍යවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් ප්‍රවර්ධනය කිරීමේ මූලෝපායක් වශයෙන් ගෝලීය නිෂ්පාදන හවුල්කාර ජාලයන්හි (Global Production Sharing Networks) වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 05යි)

(iv) නිදහසින් පසු කාලය තුළ ශ්‍රී ලංකාව වේගවත් ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීම වළක්වාලීමට බලපෑ සාධක විග්‍රහ කරන්න. (ලකුණු 06යි)

10. (i)- - රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම යනු රාජ්‍ය ණය ප්‍රමාණයේ තිරසාරභාවය (debt sustainability) යළි ස්ථාපිත කරගනු පිණිස අනුගමනය කරනු ලබන වැඩපිළිවෙළකි. කිසියම් රටක් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කරනුයේ ණය තිරසාරභාවය යළි ලබාගැනීම සඳහා දේශපාලනික සහ සමාජීය වශයෙන් පිළිගත හැකි වෙනත් විකල්පයක් නොමැති විටදී ය.

(ලකුණු 01යි)

- ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් අපේක්ෂා කෙරෙනුයේ මධ්‍ය කාලීන සහ දිගුකාලීන වශයෙන් දළ මූල්‍ය අවශ්‍යතා (Gross Financial Needs - GFN), දේශීය හා විදේශීය මුදලින් ලබාගත් ණය සේවාකරණය සහ රාජ්‍ය ණය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය පාලනය කරගත හැකි මට්ටමක පවත්වා ගැනීමට ය.

(ලකුණු 01යි)

- ප්‍රතිව්‍යුහගත කිරීමේ තීරණය ගත් පසුව කවර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට ඇතුළත් කර ගත යුතු ද කවරක් බැහැර කළ යුතු ද යන්න ණයගැතියා විසින් තීරණය කළ යුතු ය. එලෙස කවර ණය වර්ග ප්‍රතිව්‍යුහගත කළ යුතුදැයි තීරණය කළ පසුව පහත සඳහන් ක්‍රමවේද ඔස්සේ ප්‍රතිව්‍යුහගතකරණය ක්‍රියාවට නැගේ.
  - මුහුණත වටිනාකම පහත හෙළීම : මුළු ණය ප්‍රමාණයෙන් කොටසක් කපා හැරීම. (hair cut)
  - කල්පිරීමේ කාලය දීර්ඝ කිරීම : ණය ආපසු ගෙවීම සඳහා දීර්ඝ කාලයක් ලබා දීම.
  - පොලී අනුපාතිකයන්හි ගැළපුම් ඇති කිරීම : ණය සඳහා ගෙවිය යුතු පොලී අනුපාතික සහනදායි ලෙස අඩු කිරීම.

- බොහෝ අවස්ථාවල මෙම ක්‍රමවේද තුනම අඩුවැඩි වශයෙන් මිශ්‍රකොට යොදා ගැනේ. කෙසේ වෙතත් අවසාන වශයෙන් ඒ ක්‍රමවේද සඳහා ණය හිමියන්ගේ අනුමැතිය හිමි විය යුතු ය.

(ලකුණු 02යි)
(මුළු ලකුණු 04යි)

(ii) ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්තිමය වෙනස්කම් :
- ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ව නිමාවට පත් කිරීම.
- දූෂණය වළක්වාලීමට සහ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග
  - දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සඳහා අනුගත වීම.
  - රජයේ කොන්ත්‍රාත්තු විවෘත මිල කැඳවීම් මත ලබා දීමට අවශ්‍ය වන පරිදි ප්‍රසම්පාදන නීති රීති සැකසීය.
  - එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලය හා ලෝක බැංකුව හවුලේ

PAPERMASTER.LK

ක්‍රියාත්මක කෙරෙන කොල්ලකන ලද වත්කම් නැවත ලබා ගැනීමේ ක්‍රියාවලියට (StAR) සක්‍රීය ව සම්බන්ධවීම.

- රාජ්‍ය අයභාරය ශක්තිමත් කරමින් රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම.
- රාජ්‍ය වියදම් මැදි කාලීන රාමුවක් ඔස්සේ සැලසුම් කිරීම සහ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- පොදු සෞඛ්‍ය හා අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබා දීම.
- රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ
- මහ බැංකුවේ ස්වාධීනතාව ශක්තිමත් කරමින් මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
- නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යාම.
- ගෙවුම් ශේෂ තිරසාර භාවය උදෙසා වෙළෙඳ සහ ආයෝජන ප්‍රවාහ ධෛර්යමත් කිරීම.
- ව්‍යාපාර කිරීමේ පහසුතා දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ ස්ථානය ශක්තිමත් කිරීම උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)**

(iii) ගෝලීය නිෂ්පාදන හවුල්කාර ජාලයන්හි වැදගත්කම :

- කිසියම් භාණ්ඩයක නිෂ්පාදන ක්‍රියාවලිය සිරස් අතට අදියර වශයෙන් වෙන් කොට එක් එක් අදියර ක්‍රියාවට නැංවීම විවිධ රටවල් කරා යොමු කෙරෙන ගෝලීය නිෂ්පාදන හවුල්කාරීත්ව ජාල මෑත දශකවල දී ගෝලීය වෙළෙඳාමේ ප්‍රධාන ලක්ෂණයක් බවට පත් ව තිබේ. සාපේක්ෂ පිරිවැය වාසි හා වෙනත් මූලික ආර්ථික තීර්ණායක පදනම් කර ගනිමින් විවිධ රටවල් කරා නිෂ්පාදන ක්‍රියාවලිය විකේන්ද්‍රණය වීමක් මෙහිදී සිදුවේ.

- මෙහිදී සිදුවන්නේ කිසියම් භාණ්ඩයක විවිධ උපාංග විවිධ රටවල නිෂ්පාදනය කොට ඒවා එකලස් කිරීම සඳහා තවත් රටක් කරා යොමු කිරීම ය. උදාහරණයක් වශයෙන් ටොයෝටා මෝටෝ රථය ජපානයේ නිෂ්පාදනය කරනු ලැබුවත් එය සමන්විත වන විවිධ උපාංග නිපදවනුයේ ලෝකයේ විවිධ රටවල ඇති කර්මාන්ත ශාලාවල ය.

**(ලකුණු 02යි)**

- යම් රටකට කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් මුළුමනින් ම නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන සම්පත් හෝ තාක්ෂණය හෝ නොමැති විටක එම නිෂ්පාදන ක්‍රියාවලියේ කිසියම් අදියරකට පමණක් තමන්ට සහභාගි විය හැකි නම් ඒ සඳහා අවස්ථාව ගෝලීය නිෂ්පාදන හවුල්කාරීත්වය යටතේ උදා වේ. රට තුළ සම්පත් සම්භාරයක් නොතිබීම විදේශ වෙළෙඳාමේ සංරෝධකයක් වශයෙන් තවදුරටත් ක්‍රියාත්මක නොවේ.

**(ලකුණු 02යි)**

- අද දක්වා ම ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන පදනම් කරගත් බොහෝ නිෂ්පාදන කර්මාන්ත ගැනුම්කරුවා-මෙහෙයවනු ලබන (buyer-driven) ගෝලීය නිෂ්පාදන ජාලයන් ය. ඇඟලුම්, පාවහන් වැනි භාණ්ඩ මුළුමනින් ම අප රටෙහි නිෂ්පාදනය කෙරෙන අතර එම අවසාන භාණ්ඩ, ගැනුම්කරුවා විසින් මිලට ගෙන විදේශ වෙළෙඳපොළවල අලෙවි කෙරේ. ගැනුම්කරුවා මෙහෙයවන මෙබඳු ගෝලීය නිෂ්පාදන ජාල ගෝලීය නිෂ්පාදන කර්මාන්තය තුළ 12%ක් තරම් කුඩා ප්‍රමාණයක් වන අතර ඒවායේ වැදගත්කම තවදුරටත් පහළ වැටෙමින් පවතී. අනික් අතට නිෂ්පාදකයා විසින් මෙහෙයවනු ලබන (Producer - driven) ගෝලීය නිෂ්පාදන ජාල ලෝක නිෂ්පාදන කර්මාන්තය තුළ 51%කට වඩා වැඩි වැදගත්කමක් උසුලන අතර එම ප්‍රතිශතය තවදුරටත් ඉහළ යමින් පවතී. මෙබඳු නිෂ්පාදන ක්‍රියාවලියක ලක්ෂණය වන්නේ කිසියම් භාණ්ඩයක නිෂ්පාදන ක්‍රියාවලියෙහි අවසාන අදියරෙහි සිටින නිෂ්පාදකයා

PAPERMASTER.LK

ලෝකයේ විවිධ රටවලින් ලබා ගන්නා එම භාණ්ඩයට අදාළ උපාංග එකළස් කොට, අවසාන භාණ්ඩය වෙළෙඳපොළට සැපයීම ය. මෙහි දී සිදුවන්නේ රටවල් රාශියක් අවසාන භාණ්ඩය නිෂ්පාදනය කිරීමට දායක වීම ය. ශ්‍රී ලංකාව අනුගත විය යුත්තේ ද මෙම ප්‍රවණතාව සමඟ ය. එසේ නොවුවහොත් සදාකාලික ව ශ්‍රී ලංකාවට මැදි ආදායම් රටක් වශයෙන් එකම තැන රැඳී සිටීමට සිදුවනු ඇත.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 05යි.)

(iv) - දිගුකාලීන හා තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනයක් සඳහා අවශ්‍යකරන පූර්ව කොන්දේසි කිසිවක් අප රටේ දක්නට නොමැත. ජාතික සමගිය, දේශපාලන ස්ථාවරත්වය, නීතියේ ආධිපත්‍යය, දූෂණය මුලිනුපුටා දැමීම, ප්‍රායෝගික ආර්ථික ප්‍රතිපත්ති සහ ඒවා කාර්යක්ෂ ම ක්‍රියාත්මක කිරීම මෙම පූර්ව කොන්දේසිවලට ඇතුළත් වේ. ආර්ථික නොවන මෙම පූර්ව කොන්දේසි දක්නට නොලැබීම මන්දගාමී ආර්ථික වර්ධනයට ප්‍රබල හේතුවක් ලෙස සැලකිය හැකි ය.

(ලකුණු 02යි)

- දිගු කාලීන සංවර්ධනය, නීතියේ ආධිපත්‍යය, වාර්ගික හා ආගමික සංහිඳියාව, දූෂණය පිටුදැකීම, ප්‍රායෝගික ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම සඳහා කැපවුණු ස්ථාවර ආණ්ඩු පසුගිය දශක ගණනාව මුළුල්ලේ ම හුදු සිහින පමණක් විය.

- ජනප්‍රියවාදී ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ අප රටේ බොහෝ ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂ මෙරට ජනතාව ආණ්ඩු මත යැපෙන්නන් පිරිසක් බවට පත් කොට ඇත. දේශපාලන පක්ෂවල ආර්ථික ප්‍රතිපත්තිවල ආකර්ෂණීය අංශය බවට පත්වූයේ ලබාදෙන සහන පැකේජය, ලබා දෙන රජයේ රැකියා ප්‍රමාණය සහ වෙනත් කිසිසේත් ඉටුකළ නොහැකි පොරොන්දු ය. ජනප්‍රියවාදී ප්‍රතිඵල වලට අනුගත දේශපාලකයන් කිසිසේත් අත්‍යවශ්‍ය දේශපාලන සහ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැගීමට සහයෝගයක් ලබා දී නැත.

(ලකුණු 02යි)

- මන්දගාමී ආර්ථික වෘද්ධියට බලපෑමක් ඇති කොට ඇති තවත් වැදගත් සාධක වනුයේ මිනිසුන්ගේ සාරධර්ම සහ වටිනාකම්, වැඩපොළ විනය, අධ්‍යාපනය සහ දේශපාලන සංස්කෘතියේ අයහපත් ප්‍රවණතාවන් ය. විශේෂයෙන් රාජ්‍ය අංශයේ වැඩපොළ විනය දුර්වල වීම සහ විනය විරෝධී බව රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතාවන්ට ප්‍රබල ලෙස බලපා ඇත.

- වඩාත් ප්‍රායෝගික ප්‍රතිපත්ති වෙනුවට දෘෂ්ටිවාද මත ප්‍රතිපත්ති තීරණය වීම, ගෝලීය ආර්ථිකයේ ඉඩ ප්‍රස්ථා යොදා ගනිමින් අපනයන ප්‍රවර්ධනයට අසමත් වීම, ශ්‍රම හමුදාවේ තාක්ෂණික නිපුණතා සංවර්ධනය නොවීම ආර්ථිකයේ දිගුකාලීන පසුබෑමට සෘජුව ම බලපා තිබේ.

(ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

- දේශීය ව හොඳ නැවුම් ආර්ථික ප්‍රතිපත්ති නොතිබීම.
- විදේශ ප්‍රාග්ධන ආකර්ෂණය කර ගැනීමට නිර්මාණාත්මක වැඩපිළිවෙළක් ... වෙනුවට විදේශ ණය මත රැඳී පැවතීම.

PAPERMASTER.LK

සටහන්

PAPERMASTER.LK